**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

## ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

## ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති

(2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 120 වගන්තිය යටතේ නිකුත් කරන ලදී)

**මාතෘකාව :-** (නියමුවන් රහිත ගුවන්යානා මෙහෙයුම සඳහා වන අවශ්‍යතා (මිනිසුන් රහිත ගුවන්ගත වාහන, මිනිසුන් රහිත ගුවන්යානා පද්ධති/දුරස්ථ පාලන ගුවන්යානා/ඩ්‍රෝන)

**යොමු අංකය :** CA-IS-2016 GEN-001 **SLCAIS :** 053 **දිනය :** 2017.01.10

මෙහි මින්මතු CA පනත වශයෙන් හඳුන්වනු ලබන 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 120 වගන්තිය ප්‍රකාර, CA පනතේ විධි විධාන කිසිවක් හෝ CA පනතේ උප ලේඛණයෙහි නිශ්චිත වශයෙන් සඳහන් කර ඇති ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සම්මුතියේ ව්‍යවස්ථා ඇතුළු CA පනත යටතේ පනවන ලද රෙගුලාසි හෝ රීති කිසිවක් හෝ බලාත්මක කිරීම සඳහා එසේ සිදු කිරීම අවශ්‍ය බව හෝ උචිත බව හෝ තමන් අදහස් කරන ඕනෑම අවස්ථාවක ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති නිකුත් කිරීමේ බලය සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සතුව ඇත.

ඒ අනුව, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වන මම, CA පනතේ 80 වගන්තියේ විධි විධාන යටතේ හෝ එහි උපලේඛනයේ 8 වන ව්‍යවස්ථාවේ ඇතුලත් විධි විධාන යටතේ හෝ සම්මුතියේ 2 ඇමුණුමේ 4 පරිශිෂ්ඨයේ නියම කර ඇති අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් යටතේ හෝ නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් සිදු කරන විට අනුගමනය කළයුතු, මේ සමග ඇති ඇමුණුමේ සඳහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති ( යොමු අංකය : CA-IS-2016 GEN-001- Att 01 - මාතෘකාව : නියමුවන් රහිත ගුවන්යානා මෙහෙයුම සඳහා වන අවශ්‍යතා - මිනිසුන් රහිත ගුවන්යානා පද්ධති/දුරස්ථ පාලන ගුවන්යානා/ ඩ්‍රෝන ආදිය) මෙයින් නිකුත් කරමි.

2016 පෙබරවාරි 25 දින අංක IS-053 දරන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති අභිබවා සිටින මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති වහාම ක්‍රියාත්මක වන පරිදි බලාත්මක විය යුතු අතර, නැවත දැනුම් දෙන තුරු එසේ බලාත්මකව පැවතිය යුතුය.

අනෙකුත් කරුණු අතර, ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති පිළිපැදීම පැහැර හැරීම වරදක් බව සඳහන් කෙරෙන CA පනතේ 103 වගන්තිය කෙරෙහි ද මෙහිදී අවධානය යොමු කරවනු ලැබේ.


ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය
04, හුණුපිටිය පාර
කොළඹ - 02.

එච්.එම්.සී. නිමල්සිරි
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සහ
ප්‍රධාන විධායක නිලධාරී


(අංක CA-IS-2016 GEN-001- Att 01 - මේ සමග ඇත)

ඇමුණුම

## අංක SLCAIS-053 දරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති

නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම සඳහා වන අවශ්‍යතා
(මිනිසුන් රහිත ගුවන්ගත වාහන, මිනිසුන් රහිත ගුවන්යානා පද්ධති/දුරස්ථ පාලන ගුවන්යානා/ඩ්‍රෝන)

### 1. අදාළත්වය

මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති මගින් නියම කරනු ලබන අවශ්‍යතා මෙහි මින්මතු පොදුවේ නියමුවන් රහිත ගුවන් යානා වශයෙන් හඳුන්වනු ලබන දුරස්ථ පාලන ගුවන්යානා, රැහැන් පාලන ආදර්ශ ගුවන් යානා, නිදහස් පියසර ආදර්ශ ගුවන්යානා හෝ ඩ්‍රෝන 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 80 වගන්තියෙහි සහ එම පනතේ උප ලේඛනයෙහි 8 වන ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන වයසේ ශ්‍රී ලංකා ගුවන් අවකාශ ඇතුළත මෙහෙයුම් කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

### 2. අනුමත පුද්ගලයා හෝ සංවිධානය

(අ) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සඳහා හෝ ඔහු වෙනුවෙන් හෝ මෙහි පහත සඳහන් කාර්‍යයන් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් හෝ ඉටු කිරීම සඳහා දුරස්ථ පාලන ගුවන් යානා සැලසුම් කිරීම, තැනීම හෝ මෙහෙයුම් කිරීම සම්බන්ධව උචිත විශේෂඥ භාවය ලබා ඇති පුද්ගලයෙකු හෝ සංවිධානයක් හෝ මෙහි මින් මතු අවස්ථාවෝචිත පරිදි අනුමත පුද්ගලයෙකු හෝ අනුමත සංවිධානයක් වශයෙන් හඳුන්වනු ලබන පුද්ගලයෙකු වශයෙන් හෝ සංවිධානයක් වශයෙන් හෝ අනුමත කිරීමට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වරයාට පිළිවන.

(i) නියමුවන් රහිත ගුවන්යානා මෙහෙයුම් කිරීම සඳහා දුරස්ථ නියමු යෝග්‍යතා සහතිකයක් නිකුත් කිරීම හෝ

(ii) නියමුවන් රහිත ගුවන්යානාවන් හි දුරස්ථ නියමුවන්ට උපදෙස් දීම සඳහා පුද්ගලයින් පත් කිරීම. හෝ

(iii) නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් සම්බන්ධ නෝටෑමයක් (NOTAM) නිකුත් කිරීම සඳහා ගගන නාවික තොරතුරු සේවා සැපයුම්කරු වෙත දැනුම් දීමට කිසියම් පුද්ගලයෙකුට බලය පැවරීම හෝ

(iv) නියමුවන් රහිත ගුවන් යානා තැනීමට හෝ විකරණයට හෝ බලය පැවරීම හෝ

(v) නියමුවන් රහිත ගුවන්යානයක් තැනීම, පරීක්ෂා කිරීම සහ අනුමත කිරීම හෝ

(vi) නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් කිරීමට බලය පැවරීම

(ආ) ඉහත සඳහන් විධි විධාන නොසලකා, ඔහු වෙත ඍජුව ඉල්ලීමක් ඉදිරිපත් කරන පුද්ගලයෙකුට හෝ සංවිධානයකට හෝ නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් කිරීමට අනුමැතිය දීමට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්ට පිළිවන.

(ඇ) මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි කාර්‍යයය සඳහා අනුමත පුද්ගලයෙකු ගේ හෝ අනුමත සංවිධානයක හෝ තත්ත්වය ලබා ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයෙකුට හෝ සංවිධානයකට හෝ නියමුවන් රහිත ගුවන් යානා තැනීම, මෙහෙයුම් කිරීම, නඩත්තු කිරීම සහ නියමුවන් පුහුණු කිරීම පිළිබඳ ඔහුගේ / ඇයගේ එහි පළපුරුද්ද සහ සුදුසුකම් ඉදිරිපත් කරමින් නියමිත ආකෘති පත්‍රයේ ඒ සඳහා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමට පිළිවන.

## 3. නියමුවන් රහිත ගුවන් යානා - ස්කන්ධ ප්‍රවර්ග

මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි කාර්‍යයය සඳහා නියමුවන් රහිත ගුවන් යානා ස්කන්ධය මත පදනම් කර ප්‍රවර්ග හතරකට වෙන් කරනු ලැබේ

| ස්කන්ධය | නියමුවන් රහිත ගුවන් යානා ප්‍රවර්ගය |
|---|---|
| කි. ග්‍රෑ. 25 හෝ ඊට වැඩි | A |
| කි. ග්‍රෑ. 01 ට වැඩි නමුත් කි ග්‍රෑ 25 ට අඩු | B |
| ග්‍රෑ 200 ට වැඩි නමුත් කි. ග්‍රෑ 1 ට අඩු සහ කි. ග්‍රෑ 1 | C |
| ග්‍රෑ. 200 හෝ ඊට අඩු | D |

## 4. මෙහෙයුම් පිළිබඳ සීමා කිරීම්

(අ) A ප්‍රවර්ගය

පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්නම් විනා A ප්‍රවර්ගයේ නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් කිරීම සිදු නොකළ යුතුය.

(i) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ගෙන් ඒ සඳහා ප්‍රකාශිත අනුමැතියක් ලබා ගෙන තිබීම සහ

(ii) මිනිසුන් සහිත ගුවන් යානා සම්බන්ධයෙන් අදාළ වන, පුද්ගල බලපත්‍ර ගුවන්යානා මෙහෙයුම් සහ ගුවන් යෝග්‍යතාව පිළිබඳව පල කරන ලද සියළු අවශ්‍යතා සම්පූර්ණ කර තිබීම

(ආ) B ප්‍රවර්ගය

මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් හි අදාල අවශ්‍යතාවන් අනුගමනය කිරීමට යටත්ව B ප්‍රවර්ගයට අයත් නියමුවන් රහිත ගුවන් යානයක් -

(i) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ගෙන් හෝ අනුමත පුද්ගලයෙකු ගෙන් හෝ අනුමත සංවිධානයකින් හෝ ලබාගත් බලය පැවරුමක් යටතේ සැලසුම් කිරීම, තැනීම හෝ නඩත්තු කිරීම හෝ සිදුකල හැකිය. එමෙන්ම

(ii) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ගෙන් හෝ අනුමත පුද්ගලයෙකු ගෙන් හෝ අනුමත සංවිධානයකින් හෝ ලබාගත් බලය පැවරුමක් යටතේ මෙහෙයුම් කළ හැකිය.

(ඇ) C ප්‍රවර්ගය

පුද්ගලයෙකුට හෝ දේපළ වලට හෝ සුරක්ෂිතතා තර්ජනයක් හෝ නිරුපද්‍රතතා තර්ජනයක් එල්ල කිරීමේ හෝ තුන්වන පාර්ශවයේ පුද්ගලයෙකු ගේ පෞද්ගලික භාවය උල්ලංඝනය කිරීමේ හෝ විභවයක් සහිත කැමරා, කාය-සංවේදී (Body-sensing) හෝ ස්වයං ආරෝපණ උපක්‍රමික වැනි දත්ත ග්‍රහණය කිරීමේ මෙවලම් දැරීමේ හැකියාවක් රහිත, එමෙන්ම එහි මෙහෙයුම් සඳහා අවශ්‍ය වන උපකරණ හැර වෙනත් පිටස්තර වස්තූන් රැගෙනයාමේ හැකියාවක් ද රහිත C ප්‍රවර්ගයේ නියමුවන් රහිත ගුවන් යානයක් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් විසින් එම කාර්‍යය සඳහා සහතික කරනු ලැබ ඇති විකුණුම් කරුවකු ලියාපදිංචි කිරීමෙන් පසු එකී විකුණුම්කරු විසින් සපයනු ලබන නිර්ණායකයන් අනුගමනය කිරීමට යටත්ව, මෙහෙයුම් කළ හැකිය.

(ඈ) D ප්‍රවර්ගය

D ප්‍රවර්ගයේ නියමුවන් රහිත ගුවන් යානයක් අදාළ දේපළ අයිතිකරුගේ කැමැත්ත සහිතව පෞද්ගලික ඉඩමක හෝ එම කාර්‍යය සඳහා පැහැදිළිව හඳුනා ගෙන ඇති පොදු ස්ථානයක දී හෝ පුද්ගලයින්ගේ හෝ දේපොළ හෝ නිරුපද්‍රතතාව සහ සුරක්ෂිතතාව පිළිබඳව නිසි සැළකිල්ල දක්වමින් සහ එමෙන්ම පුද්ගලයින්ගේ පෞද්ගලික භාවයේ අයිතියට ගරු කරමින් විනෝදාස්වාද හෝ අධ්‍යාපනික කාර්‍යයන් සඳහා මෙහෙයුම් කරන්නේ නම් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අනුමැතිය රහිතව බිම් මට්ටමේ සිට මීටර් 150 කට අඩු උසකින් මෙහෙයුම් කළ හැකිය.

## 5. පියසර පැහැයුම

පුද්ගලයෙකු ට හෝ දේපොල වලට හෝ සුරක්ෂිතතා හෝ නිරුපද්‍රතතා තර්ජනයක් එල්ල කිරීමේ හෝ පුද්ගලයෙකු ගේ පෞද්ගලිකත්ව අයිතිය නොකතා හැරීමේ හෝ විභවයක් සහිත කැමරා, කාය-සංවේදී (Body-sensing) හෝ ස්වයං ආරෝපණ ( self-priming) උපක්‍රමික වැනි දත්ත ග්‍රහණය කිරීමේ හෝ දත්ත ආපසු ලබා ගැනීමේ මෙවලම් කිසිවක් සවිකර ඇති කිසිදු ප්‍රවර්ගයකට අයත් කිසිදු නියමුවන් රහිත ගුවන් යානයක් පහත සඳහන් අවස්ථාවන්හි හැර, අදාළ නියමුවන් රහිත ගුවන් යානය පියාසර කරවන ගුවන් අවකාශය අයත් ප්‍රදේශය භාර ප්‍රාදේශීය පොලීසියෙන් ලබාගත් පියසර පැහැයුමක් රහිතව පියාසර නොකර විය යුතුය.

(i) අනුමත කරන ලද ගගන යාත්‍රාංගනයක දී ගගන යාත්‍රාංගනය බාරව සිටින පුද්ගලයාගෙන් ලබාගත් ලිඛිත අනුමැතියක් සහිතව නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් කිරීම

(ii) ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) විසින් බලය පවරන ලද පුද්ගලයෙකු ඉදිරියේ නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් කිරීම

## 6. නියමුවන් රහිත ගුවන් යානා නිෂ්පාදනය කිරීම, එකළස් කිරීම,ආනයනය කිරීම, අපනයනය කිරීම, විකිණීම හෝ බදු දීම

පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්නම් විනා කිසිදු පුද්ගලයෙකු කිසිදු ස්කන්ධ ප්‍රවර්ගයකට අයත් නියමුවන් රහිත ගුවන් යානයක් නිෂ්පාදනය කිරීම, එකළස් කිරීම, ආනයනය කිරීම, අපනයනය කිරීම, විකිණීම, කුළියට දීම හෝ බදු දීම සිදු නොකළ යුතුය.

(අ) අවස්ථාවෝචිත පරිදි අදාළ පුද්ගලයා නියමුවන් රහිත ගුවන් යානා නිෂ්පාදනය කිරීම, එකළස් කිරීම, ආනයනය කිරීම, අපනයනය කිරීම, විකිණීම, කුළියට දීම හෝ බදු දීම සඳහා CAASL සමග ලියාපදිංචි වී තිබීම.

(ආ) අදාළ පුද්ගලයා තමන් නිෂ්පාදනය කරන, එකළස් කරන, ආනයනය කරන, අපනයනය කරන, විකුණන, කුළියට දෙන හෝ බදු දෙන A, B හෝ C ප්‍රවර්ගයන්ට අයත් සෑම විකිණෙන නියමුවන් රහිත ගුවන් යානයකටම අදාළ යාවත්කාල කරන ලද විස්තර වාර්තාවක් පවත්වාගෙන යාම සහ එවැනි ගුවන් යානයක් තුන්වන පාර්ශවයේ පුද්ගලයෙකුට උපයෝජනය වශයෙන් ලබාදෙන්නේ නම් පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර තිබීම.

(i) තුන්වන පාර්ශවයේ පුද්ගලයාගේ නම, ලිපිනය, හදිසි අවස්ථාවක දී සම්බන්ධ විය හැකි ආකාරය පිළිබඳ තොරතුරු ( විද්‍යුත් තැපැල් ලිපිනය සහ ජංගම දුරකථන අංකය) සහ ජාතික හැඳුනුම්පත් අංකය වාර්තා කර තබා ගැනීම.

(ii) නියමුවන් රහිත ගුවන් යානයේ නිෂ්පාදනය, වර්ගය/ආකෘතිය අනුක්‍රමික අංකය සහ වෙනත් හඳුනා ගැනීමේ ක්‍රම වාර්තා කර තැබීම.

(iii) නියමුවන් රහිත ගුවන් යානය සමග සපයනු ලබන කැමරා, දුරස්ථ පාලක සහ වෙනත් සංවේදක ආදී අමතර ඒකකයන් හි නිෂ්පාදිත අනුක්‍රමික අංක වාර්තා කර තැබීම.

(iv) C - ප්‍රවර්ගය සම්බන්ධයෙන් වූ කල්හි තුන්වන පාර්ශවයේ පුද්ගලයාට පහත සඳහන් අවශ්‍යතා ලිඛිතව දැනුම්දීම.

a. මෙහෙයුම් ආරම්භ කිරීමට ප්‍රවර්ගයෙන් නියමුවන් රහිත ගුවන් යානය CAASL සමග ලියාපදිංචි කළ යුතු බව

b. නියමුවන් රහිත ගුවන් යානය මෙම ප්‍රමිති තුළ සඳහන් අවශ්‍යතාවන්ට අනුකූලව මෙහෙයුම් කරන විට ඒ සඳහා ප්‍රාදේශීය පොලිසියෙන් පියසර පැහැයුමක් ලබා ගත යුතු බව.

## 7. නියමුවන් රහිත ගුවන් යානා ලියාපදිංචි කිරීම

(අ) පුද්ගලයෙකුට හෝ දේපළ වලට හෝ සුරක්ෂිතතා තර්ජනයක් හෝ නිරුපද්‍රතතා තර්ජනයක් හෝ එල්ල කිරීමේ හෝ පුද්ගලයෙකු ගේ පෞද්ගලික භාවය පිළිබඳ අයිතීන් උල්ලංඝනය කිරීමේ හෝ විභවයක් සහිත කැමරා, කාය- සංවේදී (Body - Sensing) හෝ ස්වයං-ආරෝපණ (self-priming) උපක්‍රමික වැනි දත්ත ග්‍රහණය කිරීමේ හෝ ආපසු ලබාගැනීමේ මෙවලම් කිසිවක් සවිකරන ලද ඕනෑම ස්කන්ධ ප්‍රවර්ගයකට අයත් නියමුවන් රහිත ගුවන් යානයක් CAASL සමග ලියාපදිංචි කරනු ලැබිය යුතුය.

(ආ) A - ප්‍රවර්ගයට හෝ B - ප්‍රවර්ගයට අයත් නියමුවන් රහිත ගුවන් යානයක් CAASL සමග ලියාපදිංචි කරනු ලැබිය යුතුය.

(ඇ) C - ප්‍රවර්ගයට අයත් නියමුවන් රහිත ගුවන්යානා ලියාපදිංචි කිරීමේ අවශ්‍යතා වෙනත් ඕනෑම බලය යෙදූ ගුවන් යානයක් ලියාපදිංචි කිරීමේ දි සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා පරිදිම විය යුතුය.

(ඈ) පුද්ගලයෙකුට හෝ දේපොළ වලට හෝ සුරක්ෂිතතා තර්ජනයක් හෝ නිරුපද්‍රතතා තර්ජනයක් හෝ එල්ලකිරීමේ හෝ පුද්ගලයෙකු ගේ පෞද්ගලික භාවය පිළිබඳ අයිතීන් උල්ලංඝනය කිරීමේ හෝ විභවයක් සහිත කැමරා, කාය සංවේදී (Body – Sensing) හෝ ස්වයං - ආරෝපණ (self-priming) උපක්‍රමික වැනි දත්ත ග්‍රහණය කිරීමේ හෝ ආපසු ලබා ගැනීමේ මෙවලම් කිසිවක් සවිකර නොමැති C- ප්‍රවර්ගයට අයත් නියමුවන් රහිත ගුවන් යානයක් එය ලියාපදිංචි කිරීමට බලය ලබා ඇති එහි විකුණුම්කරු සමග ලියාපදිංචි කරනු ලැබිය යුතුය.

(ඉ) පුද්ගලයෙකුට හෝ දේපොළ වලට හෝ සුරක්ෂිතතා තර්ජනයක් හෝ නිරුපද්‍රතතා තර්ජනයක් හෝ එල්ලකිරීමේ හෝ පුද්ගලයෙකු ගේ පෞද්ගලික භාවය පිළිබඳ අයිතීන් උල්ලංඝනය කිරීමේ හෝ විභවයක් සහිත කැමරා, කාය - සංවේදී (Body – Sensing) හෝ ස්වයං - ආරෝපණ (self-priming) උපක්‍රමික වැනි දත්ත ග්‍රහණය කිරීමේ හෝ ආපසු ලබාගැනීමේ මෙවලම් කිසිවක් සවිකර නොමැති D - ප්‍රවර්ගයට අයත් මිනිසුන් රහිත ගුවන් යානයක් ලියාපදංචි කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කළ යුතුය.

(ඊ) ඒ ඒ තත්ත්වයන්ට අනුව කෙටිකාලයක් සඳහා නිකුත් කළ හැකි තාවකාලික සහතිකයක් හැරුණු විට නියමුවන් රහිත ගුවන් යානයක් සඳහා නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකයක් අවුරුදු දෙකක (02) කාලයක් සඳහා වලංගු වන අතර, ඉන් අනතුරුව අළුත් කරනු ලැබිය හැකිය.

(උ) නියමුවන් රහිත ගුවන් යානයට අයිතිකරුවකු, එකී නියමුවන් රහිත ගුවන් යානය කිනම් ආකාරයක හෝ මෙහෙයුමක යොදවන විට එම නියමුවන් රහිත ගුවන් යානය දුරස්ථව මෙහෙයවන පුද්ගලයා සෑම කල්හි එහි ලියාපදිංචි කිරීමේ සහතිකය ඔහු සන්තකයේ තබා ගන්නා බවට සහතික විය යුතුය.

(ඌ) නියමුවන් රහිත ගුවන් යානයක ලියාපදිංචි අයිතිකරුවකු එම ගුවන් යානයේ අයිතිය වෙනත් පුද්ගලයෙකුට මාරුකරන අවස්ථාවක නව අයතිකරු එකී ගුවන් යානයෙන් කිසියම් මෙහෙයුමක් සිදු කිරීමට පෙර අයිතිය මාරු කිරීම CAASL සමග ලියාපදිංචි කළ යුතුය. ගුවන් යානයේ මුල් අයිතිකරු ද අදාල ගුවන් යානයේ අයිතිය මාරු කර ඇති බව නව අයිතිකරුගේ විස්තර ද සමග CAASL වෙත දැනුම් දිය යුතුය.

(එ) පුද්ගලයෙකුට හෝ දේපොළ වලට හෝ සුරක්ෂිතතා තර්ජනයක් හෝ නිරුපද්‍රතතා තර්ජනයක් හෝ එල්ල කිරීමේ හෝ පුද්ගලයෙකු ගේ පෞද්ගලික භාවය පිළිබඳ අයිතීන් උල්ලංඝනය කිරීමේ හෝ විභවයක් සහිත කැමරා, කාය-සංවේදී (Body – Sensing) හෝ ස්වයං ආරෝපණ (self-priming) උපක්‍රමික වැනි දත්ත ග්‍රහණය කිරීමේ හෝ ආපසු ලබා ගැනීමේ මෙවලම් කිසිවක් සවිකර ඇති A, B හෝ C ප්‍රවර්ගයන්ට මෙන්ම D ප්‍රවර්ගයට අයත් කිසියම් නියමුවන් රහිත ගුවන් යානයක් CAASL ට අවශ්‍ය නම් එකී ගුවන් යානයේ ලියාපදිංචියට පූර්ව අවශ්‍යතාවක් වශයෙන් පරීක්ෂා කිරීම සඳහා CAASL වෙත හෝ නම් කරන ලද පුද්ගලයෙකු/සංවිධානයක් වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(ඒ) ලියාපදිංචිය අවලංගු කිරීම ලියාපදිංචි කරන ලද නියමුවන් රහිත ගුවන්යානයක් ස්ථිර වශයෙන් අබලන් වූ අවස්ථාවක හෝ ශ්‍රී ලංකාව ඇතුළත මෙහෙයුම් කිරීම සම්පූර්ණයෙන්ම නැවැත් වුවහොත් හෝ එකී ගුවන් යානයේ අයිතකරු ඒ බව සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වෙත දැනුම් දිය යුතුය.

## 8. නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් කරන පුද්ගලයින් ලියාපදිංචි කිරීම

(අ) A, B හෝ C ස්කන්ධ ප්‍රවර්ගයකට අයත් නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් කරන හෝ එසේ මෙහෙයුම් කිරීමට අපේක්ෂා කරන හෝ පුද්ගලයෙකු CAASL විසින් හෝ වෙනත් කිසියම් නම්කරන ලද පුද්ගලයෙකු විසින් හෝ සංවිධානයක් විසින් හෝ පවත්වනු ලබන හැකියා පිරික්සුමක් සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඒ සඳහා නියමිත ගාස්තුවක් ගෙවා දුරස්ථ නියමු බලය පැවරීමේ සහතිකයක් ලබාගත යුතුය.

(ආ) A, B හෝ C ස්කන්ධ ප්‍රවර්ගයකට අයත් නියමුවන් රහිත ගුවන් යානයක දුරස්ථ නියමුවකු, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් විසින් අන්‍යාකාරයකට ලිඛිතව බලය පවරා ඇත්නම් විනා වයස අවුරුදු 18 කට වැඩි පුද්ගලයෙකු විය යුතුය.

(ඇ) A, B හෝ C ස්කන්ධ ප්‍රවර්ගයකට අයත් නියමුවන් රහිත ගුවන් යානයක දුරස්ථ නියමුවකු ගුවන් යානයේ මෙහෙයුම් නවත්වා ඇති බව CAASL වෙත වාර්තා කර ඇත්නම් විනා ඔහුගේ /ඇයගේ බලය පැවරීමේ සහතිකය වෙත ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවා වසර දෙකක (02) වරක් අළුත් කර ගත යුතුය.

(ඈ) නියමුවන් රහිත ගුවන් යානයක ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන දුරස්ථ නියමුවකු හිමිකම් ලබන්නේ සීමිත කාල පරිච්ඡේදයක් සඳහා වලංගු වන පරිදි CAASL සමග සිදු කෙරෙන තාවකාලික ලියා පදිංචියකට පමණකි.

## 9. හඳුනා ගැනීමේ මුද්‍රාව

(අ) A, B හෝ C ස්කන්ධ ප්‍රවර්ගයකට අයත් නියමුවන් රහිත ගුවන් යානාවක් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් විසින් හෝ ඔහු විසින් නිසි පරිදි බලය පවරන ලද පුද්ගලයෙකු හෝ සංවිධානයක් විසින් හෝ නිකුත් කරන ලද හඳුනා ගැනීමේ මුද්‍රාවක් සහිතව විනා ශ්‍රී ලංකාවේ කිසිදු පෙදෙසක මෙහෙයුම් කරනු නොලැබිය යුතුය.

(ආ) නියමුවන් රහිත ගුවන් යානයක් මත ප්‍රදර්ශනය කෙරෙන හඳුනා ගැනීමේ මුද්‍රාවක ගුවන් යානයේ ලියාපදිංචි අංකය, අයිතිකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ ඔහුගේ හදිසි ඇමතුම් අංක සඳහන් විය යුතුය.

## 10. වාණිජ කාර්‍යයන් සඳහා නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් කිරීම

අවස්ථාවෙන් අවස්ථාවට වෙන වෙනම සිදු කෙරෙන පදනම මත නියමිත ගාස්තුව ගෙවා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ගෙන් ඒ සඳහා ලබාගත් විශේෂ අනුමැතියක් සහිතව විනා කිසිදු ස්කන්ධ ප්‍රවර්ගයකට අයත් නියමුවන් රහිත ගුවන් යානයක් කුලියක් සඳහා හෝ ප්‍රතිලාභයක් සඳහා හෝ මෙහෙයුම් නොකළ යුතුය.

## 11. ගුවන් ගත කාර්‍යයන් සඳහා නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් කිරීම

අවස්ථාවෙන් අවස්ථාවට වෙන වෙනම සිදු කෙරෙන පදනම මත නියමිත ගාස්තුව ගෙවා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ගෙන් ලබාගත් විශේෂ අනුමැතියක් සහිතව විනා කිසිදු ස්කන්ධ ප්‍රවර්ගයකට අයත් නියමුවන් රහිත ගුවන් යානයක් කිසිදු ගුවන් ගත කාර්‍යයක් සඳහා මෙහෙයුම් නොකළ යුතුය.

## 12. රැහැන් පාලන ආදර්ශ ගුවන් යානා

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ගෙන් ලබාගත් පූර්ව අනුමැතියක් රහිතව මීටර් 30 කට වැඩි දිග ඒකළ හෝ බහු රැහැන් පද්ධතියක් සමග රැහැන් පාලන ආදර්ශ ගුවන් යානයක් මෙහෙයුම් නොකළ යුතුය.

## 13. නියමුවන් රහිත ගුවන් යානා නිරුපද්‍රතව මෙහෙයුම් කිරීම

(අ) පුද්ගලයින් හෝ දේපොළ අනතුරෙහි නොහෙලා නිරුපද්‍රත මෙහෙයුමක් සහතික කරමින් අපේක්ෂිත පියසරයට පූර්වයෙන් අදාල ගුවන් යානයේ ප්‍රචාලක ක්‍රමය, බල ප්‍රභවය සහ විධාන සහ පාලන ආදී සාමාන්‍ය මෙහෙයුම් සඳහා පරීක්ෂා කර හරි වැරදි බැලීමෙන් පසුව විනා කිසිදු ස්කන්ධ ප්‍රවර්ගයකට අයත් නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් නොකළ යුතුය.

(ආ) නියමුවන් රහිත ගුවන් යානාවකට සම්බන්ධ කර ඇති දුරමාන උපකරණ වැනි බාහිර උපක්‍රමික ආරක්ෂිතව පවතින බවටත් එයින් ගුවන් යානයේ පියසර ලාක්ෂණිකයන්ට හෝ පාලන හැකියාවට අහිතකර බලපෑමක් ඇති නොවන බවටත් සහතිකවිය යුතුය.

(ඇ) නියමුවන් රහිත ගුවන් යානයක් දුරස්ථව මෙහෙයුම් කරන පුද්ගලයෙක් සෑම විටම මෙහෙයුම් ස්ථානය සහ අපේක්ෂිත පියසර මාර්ගය පිළිබඳ සම්ප්‍රජානනයක් පවත්වා ගත යුතුය. මෙහෙයුම් ප්‍රදේශයේ පෙනෙන මානයේ ඇති වෙනත් ගුවන් යානා, පුද්ගලයින් සහ දේපොළ පිළිබඳව සිහියෙන් සිටිය යුතු අතර, ගැටුමක් වැළක්වෙන ලෙසත්, වෙනත් ගුවන් යානාවන්ට නියමුවන් රහිත ගුවන් යානය මග හැරීම සඳහා කටයුතු කිරීමට සිදුවීම වැළැක්වෙන ලෙසටත් තමන්ගේ ගුවන් යානය හැසිරවිය යුතුය.

(ඈ) නියමුවන් රහිත ගුවන් යානයක් අපරිස්සමින් සහ නොසැලකිලිමත් ආකාරයට මෙහෙයුම් නොකළ යුතුය.

(ඉ) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් විසින් අන්‍යාකාරයෙන් බලය පවරනු ලැබ ඇත්නම් විනා නියමුවන් රහිත ගුවන් යානයක් නොට් 87 (87 Knots) ( පැයට සැතපුම් 100) කට වැඩි භූමි වේගයකින් පියාසර නොකළ යුතුය.

(ඊ) හදිසි සැඩ සුළං, වැස්ස, ගිගුරුම්, විදුලි කෙටීම හෝ වෙනත් අහිතකර කාලගුණ තත්ත්වයන් යටතේ හෝ දෘෂ්‍යතාව 5 k m ප්‍රමාණයෙන් පහළ බැස ඇති අවස්ථාවන්හි හෝ නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් නොකළ යුතුය.

(උ) නියමුවන් රහිත ගුවන් යානා දුරස්ථව මෙහෙයුම් කරන පුද්ගලයෙකු කිසියම් නිශ්චිත වේලාවකදී නියමුවන් රහිත ගුවන් යානා එකකට වැඩි සංඛ්‍යාවක් එක්වර මෙහෙයුම් නොකළ යුතුය.

(ඌ) චලනය වන වාහනයක සිට හෝ චලනය වන වේදිකාවක සිට නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් කිරීම සිදු නොකළ යුතුය.

(එ) පියසර අනතුරක දී සිදු වන හදිසියක දී, අනපේක්ෂිත සහ කලින් නොදුටු බරපතල සිදුවීමකදී හෝ අප්‍රමාද සහ හදිසියේ කටයුතු කිරීමට සිදුවන තත්ත්වයකදී එවැනි අවශ්‍ය හදිසි ක්‍රියා මාර්ග ගත යුත්තේ පුද්ගලයින්ට තුවාල සිදුවීම හෝ දේපොළ හානි වීම අවම වන ආකාරයටය.

(ඒ) නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් සිදු කිරීමේ දී එසේ එම ගුවන් යානා දුරස්ථව මෙහෙයුම් කරන පුද්ගලයා මෙම රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළයුතු අතර එවැනි මෙහෙයුම් පාලනය කරන අනිකුත් අදාළ පොදු නීති සියල්ල ද පිළි පැදිය යුතුය.

## 14. නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් කරන පුද්ගලයාගේ තත්ත්වය

පහත සඳහන් තත්ත්වයන් හි පසුවන කිසිදු පුද්ගලයෙක් නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් නොකළ යුතුය.

(අ) මෙහෙයුම් සහ ගුවන් යානය නිරුපද්‍රිතව හැසිරවීම පිළිබඳව සමීප දැනුමක් නැත්නම් ;

(ආ) යහපත් ශාරීරික සහ මානසික සෞඛ්‍ය තත්ත්වයක පසු නොවන්නේ නම්;

(ඇ) මධ්‍යසාරයෙන් මත් වී සිටින්නේ නම් හෝ මනෝ ක්‍රියාකාරී ද්‍රව්‍යයන් හි බල පෑමට යටත්ව සිටින්නේ නම්;

(ඈ) සමාජ වගකීම පිළිබඳ ස්ථිර හැඟීමක් නොමැති නම්.

## 15. තුන්වන පාර්ශවයන්හි ප්‍රජා අයිතීන් පිළිබඳව නියමුවන් රහිත ගුවන් යානා දුරස්ථව මෙහෙයුම් කරන පුද්ගලයෙකු ගේ වගකීම

දුරමාන (Telemetry) උපක්‍රමික සවිකරන ලද නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් කරන විට එකී නියමුවන් රහිත ගුවන් යානය දුරස්ථව මෙහෙයුම් කරන පුද්ගලයා සෑම විටම ඔහු / ඇය ග්‍රහණය කර ගන්නේ කලින් සැලසුම් කල සහ අපේක්ෂා කල වස්තූන් පමණක් බව අවලෝකනය කල යුතු අතර, කිසිදු අවස්ථාවක තුන්වන පාර්ශවයන්ගේ පෞද්ගලිකත්වයට ප්‍රජා අයිතීන්ට සහ සිවිල් නිදහසට හානියක් වන පරිදි කටයුතු නොකරන බවට සහතික විය යුතුය.

## 16. මෙහෙයුම් සීමා කරන ලද ප්‍රදේශ

(අ) මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති මගින් අන්‍යාකාරයෙන් අවසර දීඇත්නම් විනා අදාල ස්ථානය භාර ගුවන් ගමන් පාලන ඒකකයෙන් ලබාගත් අනුමැතියක් රහිතව C, D හෝ E පංතියේ ගුවන් අවකාශය ඇතුළත නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් නොකළ යුතුය.

(ආ) එසේ ඉදිරියෙන් සඳහන් ආකාරයට විනා පහත සඳහන් ගගන යාත්‍රාංගන විශේෂයන් හි මායිමේ සිට සැතපුම් පහක (05) දුරක් මත හෝ ඉන් ඇතුළත හෝ නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් නොකළ යුතුය.

(i) පාලනයක් රහිත ගගන යාත්‍රාංගනයක :

(a) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අනුමැතිය සහිතව සහ ගගන යාත්‍රාංගන මෙහෙයුම්කරු සමග ඇතිකර ගන්නා ගිවිසුමක් සහිතව මෙහෙයුම් සිදුකිරීමට බාරගන්නේ නම් විනා; සහ

(b) නිදහස් පියසර ආදර්ශ ගුවන් යානයක් සම්බන්ධයෙන් වූ කල්හි සක්‍රීය ධාවන පථයක යටි සුළඟට ගුවන් යානයේ පියසරය ආරම්භ කරන්නේ නම් විනා; සහ

(c) දුරස්ථ පාලන ගුවන් යානයක් සම්බන්ධයෙන් වන කල්හි:

i. නියමුවන් රහිත ගුවන් යානය පියසරයෙහි යෙදෙන අතරතුර එය නිරීක්ෂණය කිරීමට එම ගුවන් යානය දුරස්ථව මෙහෙයුම් කරන එකිනෙක පුද්ගලයා සමග නිරීක්ෂකයෙකු බැගින් සිටින්නේ නම් විනා; සහ

ii. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වෙනත් ආකාරයකට අනුමත කර ඇත්නම් විනා නියමුවන් රහිත ගුවන් යානය භූමි මට්ටමේ සිට අඩි 150 කට වැඩි උසකින් මෙහෙයුම් නොකරන්නේ නම්; විනා

(ii) පාලනය සහිත ගගන යාත්‍රාංගනයක - අදාළ ගුවන් ගමන් පාලන (ATC) ඒකකයෙන් සහ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ගෙන් ලබාගත් බලය පැවරුමකට අනුකූලව නියමුවන් රහිත ගුවන් යානයක මෙහෙයුම් කරන්නේ නම් විනා; සහ

(iii) ඕනෑම ගගන යාත්‍රාංගනයක - නියමුවන් රහිත ගුවන් යානය දුරස්ථව මෙහෙයුම් කරන පුද්ගලයා ඒ සඳහා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ගෙන් පූර්ව අනුමැතියක් ලබාගෙන ඇත්නම් විනා; සහ

(a) එම පුද්ගලයා අනුමත පුද්ගලයකු විසින් හෝ අනුමත සංවිධානයක් විසින් හෝ නිකුත් කරන ලද දුරස්ථ නියමු යෝග්‍යතා සහතිකයක් දරන්නෙකු හෝ එවැනි සහතිකයක් දරන්නෙකු ගේ ඍජු අධීක්ෂණය යටතේ කටයුතු කරන්නෙකු වන්නේ නම් හෝ ;

(b) එම පුද්ගලයා අනුමත පුද්ගලයෙකු විසින් හෝ අනුමත සංවිධානයක් විසින් හෝ නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් පිළිබඳව උපදෙස් දීමට පත්කරන ලද පුද්ගලයෙකු ගේ ඍජු අධික්ෂණය යටතේ කටයුතු කරන්නේ නම් හෝ ;

(c) එම පුද්ගලයා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් විසින් නිකුත් කරන ලද ගුවන් නියමු බලපත්‍රයක් හෝ සහතිකයක් දරන්නෙකු නම් විනා

(ඇ) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් අත්‍යාකාරයකට බලය පවරා ඇත්නම් විනා නියමුවන් රහිත ගුවන් යානයක් ශ්‍රී ලංකාවේ කිසිදු ප්‍රදේශයක් තුල පහත සඳහන් පරිදි මෙහෙයුම් නොකළ යුතුය.

(i) සක්‍රීය ගුවන් තොටුපොළක චලන ප්‍රදේශ මත හෝ ඊට ඉහළින් ; හෝ
(ii) කිසියම් සක්‍රීය ධාවන පථ තීරු ප්‍රදේශයක් මත හෝ ඊට ඉහළින් ; හෝ
(iii) පුද්ගලයින් සමූහයකට හෝ පොදු රැස්වීමකට ඉහළින් ; හෝ
(iv) සංකූලිත ප්‍රදේශ වලට ඉහළින් ; හෝ
(v) මහා මාර්ග හෝ දුම්රිය මාර්ග දිගේ හෝ ඊට ඉහළින් ; හෝ
(vi) විවෘත විදුලිය රැහැන් මගට යටින් හෝ ඊට ඉහළින් ; හෝ
(vii) සංදේශණ කුළුණු සමීපයෙන් ; හෝ
(viii) අනුමැතිය රහිතව ජාතික වනෝද්‍යාන සහ පුරා විද්‍යා වැඩ බිම් වලට ඉහළින් සහ ආරක්ෂිත ප්‍රදේශ වලට හෝ සුරක්ෂිතතා ආයතන වලට ඉහළින්.

(ඈ) පහත සඳහන් ස්ථානයන් හි සිදු කරනු ලබන ආවරණය කරන ලද මෙහෙයුමක් සම්බන්ධයෙන් 16 (ආ) වගන්තිය අදාළ නොවන්නේය.

(i) ගගන යාත්‍රාංගනයේ මායිමෙන් පිටත ; සහ
(ii) ගුවන් යානයේ පියසරය වැලැක්වීමේ හැකියාව සහිත බාධකයක් මගින් ස්වාභාවිකව ගගන යාත්‍රාංගනයේ වෙන්වී ඇති ගුවන් අවකාශකයක.

## 17. ගුවන් අවකාශය

(අ) පහත සඳහන් ආකාරයකට, නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් නොකළ යුතුය.

(i) කිසියම් දේපොළක පදිංචි වී සිටින පුද්ගලයින්ගේ එම දේපොළ අයිති කරුගේ ප්‍රකාශිත පූර්ව අනුමැතිය ලබාගෙන ඇත්නම් විනා එම දේපොළට ඉහළින් ; සහ

(ii) තුන්වන පුද්ගලයෙකුට හෝ ඔහුගේ දේපොළ වලට හෝ නිරුපද්‍රතතා හෝ සුරක්ෂිතතා උවදුරකට හේතුකාරක වෙමින්; සහ

(iii) ගුවන් නියමුවන් රහිත ගුවන් යානය මෙහෙයවන ගුවන් අවකාශය අවට මෙහෙයවන වෙනත් ගුවන් යානා පිළිබඳ නිරීක්ෂණයක් පවත්වා ගැනීමෙන් තොරව; සහ

(iv) 16 (ඇ) ඡේදයට අනුකූලව හැර භූමි මට්ටමේ සිට අඩි 150 කට වැඩි කිනම් හෝ උසකින්.

(ආ) ගුවන් යානය මෙහෙයුම් කරනු ලබන්නේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ගෙන් හෝ අනුමත සංවිධානයකින් ලබාගත් බලය පැවරුමක් යටතේ නම් 16 (ආ) (i) ඡේදයේ විධි විධාන කිසිවක් අදාළ නොවනු ඇත.

(ඇ) පහත සඳහන් පරිදි මෙහෙයුම් සිදු කරන්නේ නම් නියමුවන් රහිත ගුවන් යානයක් ගගන යාත්‍රාංගනයක සිට සැතපුම් පහ (5) කට වැඩි දුරකින් සහ භූමි මට්ටමේ සිට අඩි 150 කට වැඩි උසකින් මෙහෙයුම් කළ හැකිය.

(i) මෙහෙයුම් සිදු වන්නේ එම කාර්‍යය සඳහා නම් කරන ලද සක්‍රීය ප්‍රදේශයකදී නම්; හෝ

(ii) මෙහෙයුම් සිදු වන්නේ C,D සහ E පංතියේ ගුවන් අවකාශය ඇතුළත නම් සහ අවම වශයෙන් මෙහෙයුමට පැය 24 කට පෙර අනුමත පුද්ගලයෙකු විසින් හෝ අනුමත සංවිධානයක් විසින් හෝ බලය පවරනු ලැබූ පුද්ගලයෙකු නෝටෑමයක් (NOTAM) නිකුත් කිරීම සඳහා පහත සඳහන් විස්තර ගගන නාවික තොරතුරු සේවා සැපයුම්කරු වෙත දැනුම් දෙන්නේ නම්;

a. නියමුවන් රහිත ගුවන් යානය දුරස්ථව මෙහෙයුම් කරන පුද්ගලයාගේ නම, ලිපිනය සහ දුරකථන අංකය
b. යෝජිත මෙහෙයුම් සිදු කරන ස්ථානය
c. යෝජිත මෙහෙයුමේ දිනය, වේලාව සහ එය පවත්නා කාල සීමාව
d. යෝජිත මෙහෙයුම සඳහා අපේක්ෂිත භූමි මට්ටමේ සිට උපරිම ලෙස ප්‍රමාණය

## 18. මාර්ග අයිතිය

(අ) නියමුවන් රහිත ගුවන් යානයක් දුරස්ථව මෙහෙයුම් කරන පුද්ගලයෙකු සෑම විටම එම නියමුවන් රහිත ගුවන් යානය භූමිය මත තිබෙන සහ පියසරයේ යෙදෙන සියළුම මිනිසුන් සහිත ගුවන් යානාවන්ට මාර්ග අයිතිය ලබා දෙන බවටත්, එකී මිනිසුන් සහිත ගුවන් යානාවන් ගෙන් හොඳින් ඈත්ව පවතින බවටත් සහතික විය යුතුය.

(ආ) නිදහස් පියසර ආදර්ශ ගුවන් යානයක් මෙහෙයුම් කරන පුද්ගලයෙකු ගුවන් යානයේ මෙහෙයුම ආරම්භ කිරීමට පෙර මෙහෙයුම අතරතුර කාලයේ දී තම ගුවන් යානය භූමිය මත තිබෙන හෝ පියාසරයේ යෙදෙන හෝ මිනිසුන් සහිත ගුවන් යානා සියල්ලෙන් ඈත්ව පිහිටුවන බවට සහතික විය යුතුය.

(ඇ) නියමුවන් රහිත ගුවන් යානයක් දුරස්ථව මෙහෙයුම් කරන පුද්ගලයෙකු තමන්ගේ නියමුවන් රහිත ගුවන් යානය භූමිය මත තිබෙන හෝ ජලය මතුපිට තිබෙන සියළුම චලනය වන වස්තූන්ට මාර්ගය ලබාදෙන බවට සහතික විය යුතුය.

(ඈ) නියමුවන් රහිත ගුවන් යානයක් දුරස්ථව මෙහෙයුම් කරන පුද්ගලයෙකු එම නියමුවන් රහිත ගුවන් යානය පුද්ගලයින්ගෙන්, සතුන්ගෙන්, කුරුල්ලන්ගෙන් සහ දේපොළ වලින් හොඳින් ඈත්ව පිහිටුවන බවට සහතික විය යුතුය.

## 19. ද්‍රව්‍ය හෙළීම හෝ පතාක ප්‍රදර්ශනය කිරීම

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ගෙන් ඒ සඳහා අනුමැතියක් නොලබා නියමුවන් රහිත ගුවන් යානයකින් කිසිවක් බිම හෙළීම හෝ එම ගුවන් යානය මත කිසිදු පතාකයක් ප්‍රදර්ශනය කිරීම හෝ සිදු නොකළ යුතුය.

## 20. ඇදගෙන යාම

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ගෙන් ලබාගත් නිශ්චිත අනුමැතියක් රහිතව, පියසරයේ යෙදෙන නියමුවන් රහිත ගුවන් යානයකින් කිසිවක් ඇදගෙන යාම සිදු නොකළ යුතුය.

## 21. කිසියම් පිටස්තර වස්තුවක් රැගෙන යාම

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ගෙන් ලබාගත් නිශ්චිත අනුමැතියක් රහිතව නියමුවන් රහිත ගුවන් යානයක් තුළ කිසිදු පිටස්තර වස්තුවක් රැගෙන යාම සිදු නොකළ යුතුය.

## 22. දෘෂ්‍ය දර්ශන රේඛා මෙහෙයුම

(අ) පහත සඳහන් ස්ථානයන් හි සහ තත්ත්වයන් යටතේ නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් කිරීම සිදු නොකළ යුතුය.

- (i) ගුවන් යානය මෙහෙයුම් ගුවන් අවකාශයේ අවට දර්ශනය ගුවන් යානය මෙහෙයුම් කරන පුද්ගලයාට හරි හැටි නොපෙනෙන පරිදි අවහිර වී ඇති කිසියම් ප්‍රදේශයකට ඉහළින්;
- (ii) ඔසවන ලද භූමියක, ගොඩනැගිල්ලක හෝ කිසියම් වස්තුවක් මත සිට;
- (iii) ගුවන් යානයේ දෘෂ්‍ය දර්ශන රේඛා පවත්වාගෙන යාමට එය මෙහෙයුම් කරන පුද්ගලයාට ඇති හැකියාව අවහිර කරන කාල ගුණ තත්ත්වයන් යටතේ.

(ආ) නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් කරන පුද්ගලයා සෑම කල්හිම;

(i) නියමුවන් රහිත ගුවන් යානය සමග දෘෂ්‍ය දර්ශන රේඛාව පවත්වාගෙන යා යුතුය.

(ii) නියමුවන් රහිත ගුවන් යානය මෙහෙයුම් කරන අවට ගුවන් අවකාශය දැකීමට සමත් විය යුතුය.

(iii) නියමුවන් රහිත ගුවන් යානය වලාකුළු මූලයට පහළින් පවත්වාගත යුතුය.

(ඇ) මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි කාර්ය සඳහා දෘෂ්‍ය දර්ශන රේඛාව යනුවෙන් අදහස් කරනුයේ, එම රේඛාව ඔස්සේ නිරීක්ෂකයෙකුට පැහැදිලි දර්ශනයක් ලැබෙන ඍජු රේඛාවක් වන අතර එය පහත සඳහන් දෑ පාවිච්චි කිරීමෙන් ද සාක්ෂාත් කර ගත හැකිය.

(i) ඇස්කණ්ණාඩි, ස්ප්ර්ශක කාච හෝ පාවිච්චි කරන්නාගේ අව ප්‍රමාණ පෙනීම සාමාන්‍ය ප්‍රමාණයට වැඩි නොවන ප්‍රමාණයක් දක්වා නිවරද කළ හැකි ඒ හා සමාන උපක්‍රමිකයක් (ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, විද්‍යුත්-චුම්බක, ප්‍රකාශ හෝ විද්‍යුත් - ප්‍රකාශ උපකරණයක් පාවිච්චි කිරීම නොවේ)

(ii) පහත සඳහන් දෑ පවත්වාගෙන යන පුහුණු සහ නිපුණතාව සහිත නිරීක්ෂකයෙකු;

a. ගුවන් යානයේ දෘෂශ දර්ශන රේඛාව,
b. නියමුවන් රහිත ගුවන් යානය මෙහෙයුම් කරන අවට ගුවන් අවකාශයේ දර්ශනය,
c. නියමුවන් රහිත ගුවන් යානය මෙහෙයුම් කරන පුද්ගලයා සමග ඍජු සංනිවේදනය.

## 23. රාත්‍රී මෙහෙයුම්

ඇඳිරි වැටීමෙන් විනාඩි 20 කට පසු සිට අරුණෝදයට විනාඩි 20 කට පෙර දක්වා වූ කාලය තුළ මතු දැක්වෙන ආකාරයකට විනා නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් නොකළ යුතුය.

(අ) ප්‍රමාණවත් ආලෝකයක් සහිතව ගෘහස්ථව,

(ආ) ප්‍රමාණවත් ප්‍රදීපනයක් සමග ආවරණය කළ මෙහෙයුමක් වශයෙන්,

(ඇ) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ගෙන් ලබාගත් නිශ්චිත බලය පැවරුමක් යටතේ.

## 24. ගුවන් තරඟ

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ගෙන් ලබාගත් විශේෂ අනුමැතියක් රහිතව නියමුවන් රහිත ගුවන් යානයක් ධාවන තරඟයක හෝ කිසියම් ආකාරයක වෙනත් තරඟයක මෙහෙයුම් කිරීම සිදු නොකළ යුතුය.

## 25. විකරණ

දැනටමත් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් ගේ, අනුමත පුද්ගලයකුගේ හෝ අනුමත සංවිධානයක හෝ අනුමැතිය ලැබී ඇති නියමුවන් රහිත ගුවන් යානයක් විකරණය සඳහා අවශ්‍ය අනුමැතියකින් තොරව විකරණයට භාජනය නොකළ යුතුය.

## 26. ගුවන් විදුලි නිරෝධනය

ගුවන් විදුලි සංනිවේදනයට, ගුවන් යානා සංතරණයට, ගුවන් යානා සෝදිසියට සහ / හෝ ගුවන් ගමන් කළමණාකරන පද්ධතියට අවහිරයක් සිදු නොවන පරිදි නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් කිරීම සිදු නොකළ යුතුය.

## 27. අනතුරු/සිදුවීම් වාර්තා කරණය

නියමුවන් රහිත ගුවන් යානයක් දුරස්ථව පාලනය කරන පුද්ගලයෙකු කිසියම් නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුමකදී සිදුවන පෞද්ගලික හෝ පොදු දේපොළ විනාශ වීමක් සහ තුන්වන පාර්ශවයට සිදුවන කිසියම් තුවාලයක් ඇතුළත් කිසියම් අනතුරක් හෝ සිදුවීමක් හෝ එසේ සිදු වූ ස්ථානයට ආසන්නතම පොලිස් ස්ථානය වෙත වහාම වාර්තා කළ යුතුය.

නියමුවන් රහිත ගුවන් යානයේ අයිතිකරු/එය දුරස්ථව මෙහෙයුම් කළ පුද්ගලයා හැකිතාක් ඉක්මණින්, එහෙත් සිදුවීමේ පටන් පැය 48 කට වැඩි කාලයක් ප්‍රමාද නොවී එම සිදුවීම පිළිබඳ වාර්තාවක් CAASL වෙත ඉදිරිපත් කළ යුතුය. එම වාර්තාවෙහි පහත සඳහන් තොරතුරු ඇතුළත් විය යුතුය.

1. අයිතිකරුගේ නම සහ සම්බන්ධ කරගත හැකි ක්‍රම
2. මෙහෙයුම්කරුගේ නම සහ සම්බන්ධ කරගත හැකි ක්‍රම
3. නියමුවන් රහිත ගුවන් යානය සඳහා නිකුත් කරන ලද ලියා පදිංචියේ තොරතුරු
4. අනතුරු සිදු වූ ස්ථානය
5. අනතුර සිදු වූ දිනය
6. අනතුර සිදු වූ වේලාව
7. තුවාල ලැබූ පුද්ගලයා/පුද්ගලයින් සහ තුවාලවල තරම-එවැන්නක් ඇත්නම් සහ එවැන්නක් පිළිබඳව දැනුවත් නම්

8. හානි සිදුවූ දේපොළ සහ හානියේ ප්‍රමාණය - එවැන්නක් සිදු වුනි නම් ඒ පිළිබඳ දැන ගන්නට ඇත්නම්
9. සිදු වූ දේ පිළිබඳ විස්තරයක්

## 28. නිදහස් කිරීම

සෙවීම සහ මුදා ගැනීම, ගුවන් යානා අනතුරු සහ ජාතික ව්‍යවසන වැනි අවස්ථාවන්හි පොදු සංවිධාන විසින් ක්‍රියාත්මක කරනු ලබන මානව හිතවාදී සහන මෙහෙයුම් මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි ඇතුළත් අවශ්‍යතාවන් ගෙන් නිදහස් කිරීම සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්ට පිළිවන.

## 29. රක්ෂණ ආවරණය

අවම වශයෙන් තුන්වන පාර්ශවයේ තුවාල සහ / හෝ හානි සඳහාවත් ලබාගත් වලංගු රක්ෂන ආවරණයක් රහිතව A, B හෝ C ස්කන්ධ ප්‍රවර්ගයකට අයත් කිසිදු නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් නොකළ යුතුය.

## 30. වෙරළෙන් ඔබ්බෙන් මෙහෙයුම් තහනම් කිරීම

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අනුමැතිය රහිතව ශ්‍රී ලංකාවට අයත් දේශීය මුහුදු තීරය ඇතුළත නියමුවන් රහිත ගුවන් යානා යොදාගත් වෙරළෙන් ඔබ්බේ මෙහෙයුම් (off Shore operations) සිදු නොකළ යුතුය.

## 31. නිදහස් නොකිරීම

නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් කිරීමට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් විසින් ප්‍රදානය කරන ලද අනුමැතිය හේතුවෙන් අදාල මෙහෙයුම් කරුවා මෙහෙයුම් ප්‍රදේශය / මෙහෙයුම් දිනය / වේලාවන් සහ / හෝ අපේක්ෂිත මෙහෙයුමේ ස්වභාවය අනුව වෙනත් කිසියම් අමාත්‍යාංශයකින්, අධිකාරියකින්, මණ්ඩලයකින්, නියෝජිත ආයතනයකින් හෝ එවැනි සංවිධානයකින් ලබාගත යුතු අනුමැතියකින් නිදහස් වීමක් සිදු නොවේ.